# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 160/66 — 1975 අප්‍රේල් 24 වැනි බ්‍රහස්පතින්ද — 1975.04.24**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ජේදය — සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

අංක : /වීමිපා/12 දරණ ආහාර මිළ නියෝගය. "කිරිඟු පිටි"

මිළ පාලන පනත

නියෝගය

ත්‍රිකුණාමලය පාලන දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත්, සින්නපොඩියන් පත්කුණම් වන මම (173 අධිකාරය වන) මිළ පාලන පනත යටතේ 4 වන වගන්තියේ සහ එම පනතේ 3 (2) වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1974 අගෝස්තු 26 දින සහ අංක : 126/3 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 1974.08.20 වන දින අංක : වී/මිපා/10 දරණ ආහාර මිළ නියෝගය මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) මිට යාකර ඇති උපලේඛනයේ දෙවැනි තීරයේ සඳහන් කර තිබෙන මිළ ගණන් තිරිඟු පිටි තොග වශයෙන් විකිණීමේ දී දළ බර රාත්තල් 112 ක් එම උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් සීමාවන් ඇතුලත තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(3) මිට යාකර ඇති දෙවැනි උපලේඛනයේ දෙවැනි තීරයේ සඳහන් මිළ ගණන් තිරිඟු පිටි සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් එම උපලේඛනයේ පළමු වැනි තීරයේ සඳහන් සීමාවන් ඇතුලත සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(4) තවද මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) තිරිඟු පිටි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා හෝ තිරිඟු පිටි වරකට දළබර රාත්තල් 112 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

(ආ) තිරිඟු පිටි ඕනෑම ප්‍රමාණයක් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධ බර රාත්තල් 112 කට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

(ඇ) "තිරිඟු පිටි" යන්නට ඉරිඟු පිටි හා තිරිඟු පිටි කලවම් කරන ලද මිශ්‍රණයක් ඇතුලත් වන බවත් නියම කරමි.

(5) මෙම නියෝගයෙන් උපරිම මිළ ගණන් නියම කරනු ලබන සෑම ප්‍රදේශයක් ඇතුලත කිසිවෙකු විසින් තිරිඟු පිටි, බඩ ඉරිඟු පිටි හැර වෙනත් කිසිම ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කර නොවිකිණිය යුතු බවත් නියම කරමි.

(6) බරින් 10% කට වැඩියෙන් ඉරිඟු පිටි කළවම් කරන ලද තිරිඟු පිටි කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බවත් මෙයින් නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් උපරිම මිළ ගණන් නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක තිරිඟු පිටි සිය ස්වාමිත්වයේ හෝ පාලනයේ යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකම තිරිඟු පිටි ලීන් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා මෙම නියෝගයේ වැඩිම මිළ උසින් අඟලකට වඩා ඉලක්කම් මිළ පුවරුවල සටහන්කොට එම භාජනයට සම්බන්ධ කොට නියමිත මිළ ඕනෑම ගනුදෙනු කාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(8) එසේම මෙම නියෝගයේ කාර්ය සඳහා "රාත්තල" හෝ "රා" යන්නෙන් අදහස් කරනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බව නියම කරමි.

(9) තිරිඟු පිටි විකිණීමේදී එම තිරිඟු පිටි යම් කිසි දෙයක ඔතනු ලැබේ නම් හෝ බහාලනු ලැබේ නම් එහි මිළත් මෙම නියෝගයෙන් නියම කරනු ලබන වැඩිම මිළ ගණන් වලට ඇතුලත් වන බවද නියම කරමි.

(10) තවද, මෙම නියෝගයෙන් උපරිම මිළ ගණන් නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම තොග වශයෙන් තිරිඟු පිටි විකුණන සෑම තැනැත්තෙකුම හා සිල්ලර වශයෙන් තිරිඟු පිටි විකුණන සෑම තැනැත්තෙකුම විසින් මිළයට ගන්නා විසින් ඉල්ලන ලදහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ තිරිඟු පිටිවල බර ප්‍රමාණය ;

(ඇ) විකුණූ තිරිඟු පිටි ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් තොග වශයෙන්ද, සිල්ලර වශයෙන් ද යන වග ඇතුලත් කුවිතාන්සියක් මිළයට ගන්නා වෙත නිකුත් කල යුතු බවද නියම කරමි.

ඇස්. පත්කුණම්,
සහකාර (ආහාර) මිළ පාලක,
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය.

1975 අප්‍රේල් මස 22 වෙනි දින පෙ.ව. 9.00ට ත්‍රිකුණාමලයේදී අත්සන් කරන ලදී.

A 1—ඒ 13473 —6,700 (75/03)

පළමුවන උප ලේඛනය

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වෙනි තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් තිරිඟු පිටි දළ බර රාත්තල් 112 ක් තොග වශයෙන් විකිණිය හැකි මිළ<br>රු. ශ. |
|---|---|
| (1) ත්‍රිකුණාමලය නගර සහ කඩවත් කරවන ප්‍රාදේශිය උප දිසාපති කොට්ඨාශය ... ... ... | 123 38 |
| (2) කන්තලේ ප්‍රාදේශිය ආදයම් නිලධාරි කොට්ඨාශය .... ... ... ... ... | 123 71 |
| (3) කින්නියා ප්‍රාදේශිය ආදයම නිලධාරි කොට්ඨාශය ... ... ... ... ... | 123 56 |
| (4) තඹලගමුව ප්‍රාදේශිය උප දිසාපති කොට්ඨාශය ... ... ... ... ... | 123 59 |
| (5) නැගෙනහිර කට්ටකුලම් පත්තුව ප්‍රාදේශිය ආදයම් නිලධාරි කොට්ඨාශය සහ බටහිර කට්ටකුලම් පත්තුවේ ප්‍රාදේශිය උප දිසාපති කොට්ඨාශය ... ... ... ... ... ... | 123 78 |
| (6) මුතූර් සහ සේරුවිල ප්‍රාදේශිය ආදයම් නිලධාරි කොට්ඨාශය ... ... ... ... | 123 85 |

දෙවන උප ලේඛනය

| 1 වෙනි තීරය<br>ප්‍රදේශය | 2 වෙනි තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් තිරිඟු පිටි රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි මිළ<br>රු. ශ. |
|---|---|
| (1) ත්‍රිකුණාමලය නගරය සහ කඩවත් කරවන ප්‍රාදේශිය උප දිසාපති කොට්ඨාශය සහ තඹලගමුව ප්‍රාදේශිය උප දිසාපති කොට්ඨාශය සහ කින්නියා ප්‍රාදේශිය ආදයම් නිලධාරි කොට්ඨාශය ... ... ... ... | 01 12 |
| (2) නැගෙනහිර කට්ටකුලම් පත්තුව ප්‍රාදේශිය ආදයම් නිලධාරි කොට්ඨාශය සහ බටහිර කට්ටුකුලම් පත්තුවේ ප්‍රාදේශිය උප දිසාපති කොට්ඨාශය සහ මුතූර් ප්‍රාදේශිය ආදයම් නිලධාරි කොට්ඨාශය ... ... ... | 01 14 |
| (3) සේරුවිල ප්‍රාදේශිය ආදයම් නිලධාරි කොට්ඨාශය ... ... ... ... ... | 01 15 |

සැලකිය යුතුයි.—අංක : ඊ/මිපා/12 දරණ මෙම ආහාර මිළ නියෝගය මීට යාකර ඇති උප ලේඛනයේ සඳහන් කර ඇති මිළ ගණන් 1975 මාර්තු මස 31 වැනි දින සිට වලංගුවේ. මෙම මිළ ගණන් විකිණිය යුතු මිළ නොවේ. මෙවා විකිණිය හැකි උපරිම මිළ වන අතර එම මිළ ගණන්වලට ඉහලින් විකිණිය යුතු නොවේ.

4–556

---

මිල පාලන පනත

(173 වැනි අධිකාරය වන) මිල පාලන පනතේ 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර (ආහාර හා විවිධ ද්‍රව්‍ය) මිල පාලක විල්ප්‍රඩ ජයසූරිය වන මම, 1975.01.21 වැනි දින අංක 147/62 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1975 අංක I දරණ (කමිස) මිල පාලන ආඥාව වහාම අවලංගු කොට පහත සඳහන් පරිදි මෙයින් අණ කරමි :—

(1) මෙ ආඥාව 1975 අංක 2 දරන (කමිස) මිල පාලන ආඥාව යනුවෙන් හැඳින්විය හැකිය.

(2) මෙ ආඥාව මුළු ශ්‍රී ලංකාව තුලම අදාල විය යුතුය.

(3) මෙහි වූ උපලේඛනයේ 2 වැනි තීරයේ ඇති එක් එක් සටහනෙහි නියම කොට දක්වා ඇති මිළ ගණන් වහාම ක්‍රියාත්මක වන පරිදි එක් කමිසයක් සඳහා සිල්ලර වෙළෙන්ද අය කළ යුතු උපරිම සිල්ලර මිල විය යුතු අතර, ඒ උපලේඛනයේ 1 වැනි තීරයෙහි අනුරූප සටහනෙහි විස්තරකොට දක්වා ඇති යම් කමිසයක් ඒ මිල ගණන් වලට වඩා ඉහල මිළ ගණන් වලට කිසියම් තැනැත්තකු නොවිකිණිය යුතුය.

(4) මෙහි වූ උපලේඛනයෙහි 1 වැනි තීරයෙහි විස්තර කොට දක්වා ඇති කමිස යම් ප්‍රමාණයක් විකිණීම සඳහා තමා සතුව හෝ තමාගේ පාලනය යටතේ යම් ස්ථානයක හෝ යම් වාහනයක හෝ තබා ගෙන සිටින සැම වෙළෙන්දකු හෝ විකුණන්නකු හෝ විසින්, ඒ කමිස වර්ගවල නම් ද, උසින් අඟලකට නොඅඩු ඉලක්කම වලින්, මෙ ආඥාවෙන් ඒ කමිස සඳහා නියම කර ඇති උපරිම මිල ද, යම් ගනුදෙනුකරුවෙකුට පැහැදිලිවම පෙනෙන හැකි පරිදි දැක්වෙන දැන්වීමක් ඒ ස්ථානයෙහි හෝ ඒ වාහනයෙහි ප්‍රකටව පෙනෙන ලෙස ප්‍රදර්ශනය කළ යුතුය.

(5) මෙහි වූ උපලේඛනයෙහි 1 වැනි තීරයෙහි විස්තර කොට දක්වා ඇති යම් කමිස විකුණන සැම තැනැත්තකු විසින්ම—

(අ) ඒ විකිණීම කළ දිනය ;

(ආ) විකුණු කමිස පිළිබඳ විස්තර හා විකුණු ගණන ; සහ

(ඇ) විකුණු කමිස ගණන සඳහා අය කළ මිල ;

දක්වා තිබිය යුතු කුවිතාන්සියක් ගැනුම්කරුට දිය යුතුය.

(6) මෙහි වූ උපලේඛනයෙහි 1 වැනි තීරයෙහි විස්තර කොට දක්වා ඇති යම් කමිස වෙළෙන්දෙකු හෝ විකුණන්නකු වශයෙන් ව්‍යාපාරයෙහි යෙදී සිටින සැම තැනැත්තකු විසින්ම, ඒ ව්‍යාපාරය කර ගෙන යනු ලබන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිල පාලක වෙත 1975 මැයි මස 15 වැනි දින දවල් 12 නො ඉක්මවා පහත සඳහන් කරුණු දක්වෙන වාර්තාවක් සැපයිය යුතුය ;

(අ) ඒ වාර්තාව පිළියෙල කරනු ලබන අවස්ථාවේදී තමා සතුව හෝ තමාගේ පාලනය යටතේ ඇති කමිස තොග ප්‍රමාණය ; සහ

(ආ) ඒ තොග තබා ඇති එක් එක් ගබඩාව හෝ සෙසු ස්ථානය.

(7) පහත සඳහන් සැකසුම් ක්‍රමවල් යමකට හෝ සියල්ලට යටත්ව හෝ ඒවාට යටත් වූ ද්‍රව්‍යවලින් හෝ නිෂ්පාදනය කරන ලද කමිසවලට, එම කමිසයෙහි වර්ණගත කළ, මුද්‍රණය කළ හෝ සායම් කරන ලද ප්‍රදේශය, කමිසයේ මුළු මතුපිට ප්‍රදේශයෙන් 50%කට නොඅඩු වේ නම් මෙම නියෝගය බල නො පෑ යුතුය :—

(අ) බතික්,

(ආ) ටයි ඇන්ඩ් ඩයි,

(ඇ) තිර මුද්‍රණය.

(8) මෙහි වූ උපලේඛනයේ 2 වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති උපරිම මිලට, ඒ කමිස විකුණන විට ඒවා යම් දවටනයකින් ඔතා තිබේ නම්, හෝ ඒවා යම් බඳුනක බහා තිබේ නම්, ඒ දවටනයේ හෝ ඒ බඳුනේ මිල ඇතුලත් විය යුතුය.

විල්ප්‍රඩ් ජයසූරිය,
මිල පාලක,
(ආහාර හා විවිධ ද්‍රව්‍ය).

1975 අප්‍රේල් මස 23 වැනි දින පෙ.ව. 9.00ට කොළඹ දී අත්සන් කරන ලදී.

උප ලේඛනය

| 1 වැනි තීරය<br>විස්තරය | | 2 වැනි තීරය<br>සිල්ලර වෙළෙන්දාගේ උපරිම සිල්ලර මිල කමිස එකක් |
|---|---|---|
| (අ) කෘත්‍රිම කෙඳි/කපු මිශ්‍ර අත්දිග (මහතුන්ගේ) කමිස—කර ප්‍රමාණය අඟල් 13½ සහ ඊට වැඩි | ... | 45 0 |
| (ආ) කෘත්‍රිම කෙඳි/කපු මිශ්‍ර, අත්කොට (මහතුන්ගේ) කමිස—කර ප්‍රමාණය අඟල් 13½ සහ ඊට වැඩි | ... | 39 0 |
| (ඇ) කෘත්‍රිම කෙඳි/කපු මිශ්‍ර, (පිරිමි ළමයින්ගේ) කමිස—කර ප්‍රමාණය අඟල් 13½ දක්වා | ... | 35 0 |
| (ඈ) 100% කෘත්‍රිම රෙදි වලින් මසන ලද අත්දිග (මහතුන්ගේ) කමිස—කර ප්‍රමාණය අඟල් 13½ සහ ඊට වැඩි | ... | 41 0 |
| (ඉ) 100% කෘත්‍රිම රෙදි වලින් මසන ලද අත්කොට (මහතුන්ගේ) කමිස—කර ප්‍රමාණය අඟල් 13½ සහ ඊට වැඩි | ... | 35 0 |
| (ඊ) 100% කෘත්‍රිම රෙදි වලින් මසනලද (පිරිමි ළමයින්ගේ) කමිස—කර ප්‍රමාණය අඟල් 13½ දක්වා | ... | 31 0 |

4–557

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී